# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>2171635<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 2011/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 23/07/2024<br>පැය 0550 | | |

# මාධ්‍ය නිවේදනය

## 01. මනුෂ්‍ය ඝාතනයක් - වාලච්චේන පොලිස් වසම

2024.07.22 වන දින අළුයම් කාලයේදී පහරදීමක් හේතුවෙන් තුවාල ලැබූ පුද්ගලයෙක් වාලච්චේන රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට වාලච්චේන පොලිස් ස්ථානයට ලද පැමිණිල්ලක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 43 ක් වූ කොණ්ඩයංකේනි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු ආත්තුච්චේන ප්‍රදේශයේ කුඹුරක් රැකබලා ගැනීමේ නිරතව සිටි අයෙකු වන අතර ඔහු 2024.07.19 වන දින තම නිවසින් පිටව ගොස් එම කුඹුරේ වාඩියෙහි නැවතී සිට ඇත. යාබද කුඹුරක් රැක බලාගන්නා පුද්ගලයෙකු විසින් ඔහු පහරකෑමකට ලක්ව බිම වැටී සිටිනු දැක කුඹුරේ හිමිකරු දැනුවත් කර වාලච්චේන රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බව විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය වාලච්චේන රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සිද්ධියට අදාල සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට වාලච්චේන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. බලපත්‍ර නොමැති විදෙස් රටක නිෂ්පාදිත ගිනි අවියක් අත්අඩංගුවට - මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශය.

2019 වර්ෂයේ සිදුවූ වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවෙකු ඩුබායි රාජ්‍යයට පැන ගොස් සැඟව සිට ඇති අතර ඔහුට රතු නිවේදන නිකුත් කර තිබුණි. අනතුරුව රතු නිවේදන ප්‍රකාරව ඩුබායි රාජ්‍ය මගින් මෙම සැකකරු අත්අඩංගුවට ගෙන ඇති අතර, 2024.07.12 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් කණ්ඩායමක් ඩුබායි රාජ්‍යයට ගොස් සැකකරු මෙරටට රැගෙන විත් දින 90 ක රැඳවුම් නියෝග ලබාගෙන විමර්ශන සිදුකරමින් පවතී.

සැකකරුගෙන් සිදුකල ප්‍රශ්න කිරීම් වලදී නුගේගොඩ ප්‍රදේශයේ නිවසක් සහිත පාළු ඉඩමක ඉටි කොළ වලින් ඔතා ප්ලාස්ටික් බෝතලයක බහාලා වළ දමා තිබූ පිස්තෝල ගිනි අවියක් 2024.07.22 වන දින දහවල් කාලයේදී සොයාගෙන ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 48 ක් වන නුගේගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.**

2024.07.22 වන දින උදෑසන කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ රත්මලාන දුම්රියපොල අසලදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - රාගම පොලිස් ස්ථානය.**

2024.07.22 වන දින උදෑසන කාලයේ රාගම පොලිස් වසමේ වල්පොල වැව ප්‍රදේශයේදී රාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 250 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන පොඩිවීකුඹුර, රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පැලියගොඩ පොලිස් ස්ථානය.**

2024.07.22 වන දින උදෑසන කාලයේ පැලියගොඩ පොලිස් වසමේ නුගේ පාර අධිවේගී මාර්ගයට පහලින් ඇති මාර්ගයේදී පැලියගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 96 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන පැලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසය.**

2024.07.22 වන දින දහවල් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බෝධිරුක්ඛාරාම පාලම අසලදී බස්නාහිර පළාත දකුණ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 06**

**මිලිග්‍රෑම් 70 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන රත්මලාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ආරුගම්බේ කඳවුර.**

2024.07.22 වන දින රාත්‍රී කාලයේ පොතුවිල් පොලිස් වසමේ පසරච්චේන ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා ආරුගම්බේ කඳවුරේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **කේරළ ගංජා කිලෝ 01 ග්‍රෑම් 60 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පොතුවිල් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 64 ක් වන පරසච්චේන, පොතුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පොතුවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ඇතිමලේ පොලිස් ස්ථානය.**

2024.07.22 වන දින දහවල් කාලයේ ඇතිමලේ පොලිස් වසමේ මයුරාගම ප්‍රදේශයේදී ඇතිමලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන මයුරාගම, විලඔය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**09. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - පයාගල පොලිස් වසම.**

2024.07.22 වන දින උදෑසන කාලයේ පයාගල පොලිස් වසමේ දකුණු පයාගල වෙරළ තීරයේ කාන්තාවක් වැටී සිටින බවට ලද පණිවිඩයක් මත පයාගල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් එම ස්ථානයට ගොස් අදාල කාන්තාව නාගොඩ රෝහලට ඇතුලත් කිරීමේදී එම කාන්තාව මියගොස් සිට ඇත.

**මරණකාරියගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

මරණකාරිය වයස අවුරුදු 60 ත් 70 ත් පමණ පෙනුම ඇති, උස අඩි 05 ක් පමණ වන තළෙලු සිහින් සිරුරක් හිමි කාන්තාවකි. කොණ්ඩය වවා ඇත. මෘත ශරීරය නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පයාගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - මාතලේ පොලිස් වසම.

2024.07.22 වන දින උදෑසන කාලයේ මාතලේ පොලිස් වසමේ ඕවිලිකන්ද මාතලේ මාර්ගයේ වැලිහින්න 06 කණුව ප්‍රදේශයේදී මාතලේ දෙස සිට හල්ගොල්ල දෙසට ධාවනය වූ බස් රථයක් බස් නැවතුම්පොලක මගීන් බස්සවා නැවත ඉදිරියට ධාවනය කර ඇති අතර, එම බස් රථයේ ගමන් කළ මඟී කාන්තාවක් බස් රථයේ ඉදිරි දොරෙන් බැස බස් රථයට ඉදිරියෙන් මාර්ගය හරහා ගමන් කිරීමේදී ඉදිරියට ධාවනය වූ බස් රථයේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ මඟී කාන්තාව මාතලේ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 65 ක් වූ ඕවිලිකන්ද, මාතලේ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය මාතලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මාතලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - අහුංගල්ල පොලිස් වසම.

2024.07.22 වන දින සවස් කාලයේ අහුංගල්ල පොලිස් වසමේ ගාල්ල කොළඹ මාර්ගයේ අහුංගල්ල වැලිකන්දට හැරෙන හන්දිය අසලදී කොළඹ දෙස සිට ගාල්ල දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් ප්‍රතිවිරුද්ධ දෙසින් ගමන් කල ත්‍රීරෝද රථයක මුහුණට මුහුණ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ ත්‍රීරෝද රථ රියදුරු හා පසුපස අසුනේ ගමන් කළ මඟී කාන්තාව බලපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මඟී කාන්තාව මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 39 ක් වූ වතුරුවෙල, කොස්ගොඩ ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය බලපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට සම්බන්ධ බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර අහුංගල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - වේයන්ගොඩ පොලිස් වසම.

2024.07.22 වන දින දහවල් කාලයේ වේයන්ගොඩ පොලිස් වසමේ නයිවල උඩුගම්පොල මාර්ගයේ බංගලාවත්ත ප්‍රදේශයේදී නයිවල දෙස සිට උඩුගම්පොල දෙසට ධාවනය වූ යතුරුපැදියක් සුනඛයෙකුගේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු ගම්පහ රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 58 ක් වූ උඩුගම්පොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය ගම්පහ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. වේයන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 13. මාරක රිය අනතුරක් - තිරප්පනේ පොලිස් වසම.

2024.07.23 වන දින අළුයම් කාලයේ තිරප්පනේ පොලිස් වසමේ ඒ09 ප්‍රධාන මාර්ගයේ ගල්කුලම ප්‍රදේශයේදී හඳුනා නොගත් වාහනයක ගැටී පුද්ගලයෙකු මියගොස් ඇති බවට තිරප්පනේ පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වූ කැදෑව, අනුරාධපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. රිය අනතුර සිදුකර පලා ගිය වාහනය අත්අඩංගුවට ගැනීම සඳහා තිරප්පනේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**